# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2284/64 – 2022 ජුනි 18 වැනි සෙනසුරාදා – 2022.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/84.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. සුනිල් ලියනගමගේ මයා, ''ශාන්ති'', හේනේගම, අකුරැස්ස.
2. පී. පී. ආර්. ප්‍රනාන්දු මයා, අංක 1AF2U22 මිහිඳුසෙත් පුර, දෙමටගොඩ, කොළඹ 09.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, 3 වන මහල, ප්‍රින්ස් ඇල්ෆ්‍රඩ් කුළුණ, අංක 10, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, බටදූව, උඩුගම පාර, ෆීල්ඩ් සයිට්, නීතිඥ කේ. පී. ඩී. ගුණරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනුෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජුනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

1A – G 36984 – 09 (2022/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2020/84.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. සුනිල් ලියනගමගේ මයා, ''ශාන්ති'', හේනේගම, අකුරැස්ස.
2. පී. පී. ආර්. ප්‍රනාන්දු මයා, අංක 1AF2U22 මිහිඳුසෙත් පුර, දෙමටගොඩ, කොළඹ 09.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ෆ්‍රී ලංකා ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, 3 වන මහල, ප්‍රින්ස් ඇල්ෆ්‍රඩ් කුළුණ, අංක 10, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, කොළඹ 03.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ෆ්‍රී ලංකා ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවක සුනිල් ලියනගමගේ මහතා සහ පී. පී. ආර්. ප්‍රනාන්දු මහතා යන දෙදෙනාහට, පවත්වන ලද විනය පරීක්ෂණය අවසන් නොකර, තීරණයක් ලබා නොදී දීර්ඝ කාලයක් තබා ගැනීම මගින් අසාධාරණයක් සිදුවී තිබේද? සිදුව තිබේ නම් ඔවුන් දෙදෙනාට වෙන් වෙන් වශයෙන් හිමිවිය යුතු සහනයන් මොනවා ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 මැයි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 06 – 0172

---

මගේ අංකය: IR/COM/04/2020/24.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.02.02 වැනි දින අංක 2265/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.01.24 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ටී. ඒ. දමිත් නිස්සංක මයා, අංක 58/15, කේ. ජේ. ද සිල්වා මාවත, මහා වීදිය, මොරටුව.

2. යූ. ඩී. හර්ෂණ අබේරත්න මයා, අංක 14/ඩී, ගැමුණු පාර, පළවන පටුමග, කොතලාවල, කඩුවෙල.

3. එස්. ඒ. තිලංග සුදර්ශන මයා, අංක 91/බී, කලායතන පාර, හිරණ, පානදුර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 11-2/1, රොඩ්නි වීදිය, කොළඹ 08.

අතර පවත්නා 2022.01.21 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ජනරංජනී සුමිත් අමරසිරි මිය වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ ජනරංජනී සුමිත් අමරසිරි මිය බේරුම්කාර ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින්, යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දූන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.01.24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජූනි මස 02 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0173/1

---

මගේ අංකය: IR/COM/04/2020/24.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ටී. ඒ. දමිත් නිස්සංක මයා, අංක 58/15, කේ. ජේ. ද සිල්වා මාවත, මහා වීදිය, මොරටුව.
2. යූ. ඩී. හර්ෂණ අබේරත්න මයා, අංක 14/ඩී, ගැමුණු පාර, පළවන පටුමග, කොතලාවල, කඩුවෙල.
3. එස්. ඒ. තිලංග සුදර්ශන මයා, අංක 91/බී, කලායතන පාර, හිරණ, පානදුර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 11-2/1, රොඩ්නි වීදිය, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නාවින්න, පරණ පාර, අංක 4/103, ගමගේ සිසිර ආනන්ද කෝදාගොඩ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජූනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2020/24.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ටී. ඒ. දමිත් නිස්සංක මයා, අංක 58/15, කේ. ජේ. ද සිල්වා මාවත, මහා වීදිය, මොරටුව.

2. යූ. ඩී. හර්ෂණ අබේරත්න මයා, අංක 14/ඩී, ගැමුණු පාර, පළවන පටුමග, කොතලාවල, කඩුවෙල.

3. එස්. ඒ. තිලංග සුදර්ශන මයා, අංක 91/බී, කලායතන පාර, හිරණ, පානදුර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 11-2/1, රොඩ්නි වීදිය, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කර ඇති ටී. ඒ. දමිත් නිස්සංක, යූ. ඩී. හර්ෂණ අබේරත්න හා එස්. ඒ. තිලංග සුදර්ශන යන සේවකයින්ට ගෙවමින් තිබූ වාහන දීමනාව සහ ඉන්ධන දීමනාව 2018 සැප්තැම්බර් මස සිට නොගෙවීමෙන් එම සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේ ද ? අසාධාරණයක් සිදු ව ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 මැයි මස 17 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 06 – 0173/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.